# අවසන් වනාන්තර

**ආචාර්ය ආතර් සී. ක්ලාක්**

මිනිසුන්ගෙන් පමණක් සමන්විත වූ ලෝකයක ජීවත් වීමෙන් පලක් නැත. එය වැඩි කලක් ජීවත් වියහැකි තැනක් ද නොවනු ඇත. නාගරික ජීවිතයට, තාක්‍ෂණික සංස්කෘතියට ඇබ්බැහි වූවත් මහත් වේදනාවෙන් දූන් නැවත හදරන්නේ මෙම පාඩමයි. අපගේ මුතුන් මිත්තෝ මෙය මැනැවින් දූන සිටියහ. එක් ශාන්ත පුද්ගලයෙක් (ශාන්තුවරයෙක්) වරක් ලංකාවේ පාලකයකුට මෙසේ කීය. මහරජ අහසේ පියාසර කරන කුරුල්ලනට සහ ගොඩබිමෙ හැසිරෙන සතුනට ඔබට මෙන්ම මෙ රටෙහි රිසි තැනෙක වාසය කරන්නටත්, හැසිරෙන්නටත් සමාන අයිතියක් තිබේ. මේ පොළොව මිනිසුනටත් සියලු සතුනටත් අයත්ය. ඔබ ආරක්‍ෂකයා පමණි.

මෙය සිදුවූයේ ශතක විසිපහකට ඉහත ය. එකල මිනිසා සහ සතා අතර සහජීවනයයේදී මතුවූ ප්‍රශ්න අල්පය. එහෙත් ගතවූ විසිපස් වසරේදී ලංකාවේ ජනසංඛ්‍යාව දෙගුණ විය. මේ කුඩා දිවයිනේ තවමත් ජනගහණ තදබදයක් නැතත්, මෙහි ස්වාභාවික සෞන්දර්යය මෙතෙක් ආරක්‍ෂාවී තිබේ. බොහෝ නවීන ගැටළුවලට දූන් මෙරට මුහුණපාන බව දක්ක හැකිය. සංවර්ධනය සහ පරිසරය අතර ගැටුම, ගොවිතැන සහ වනය අතර ගැටුම, දේශීය සංස්කෘති සහ සංචාරක ව්‍යාපාරය අතර ගැටුම ......

ආපසු අතීතයට යැම කළ නොහැක්කකි. කිසිවකු සැබැවින්ම එයට කැමති නොවනු ඇත. ශත වර්ෂ ගණනක්ම මැලේරියාව බෝ කරන මදුරුවා ලංකාවේ ජන සංඛ්‍යාව ස්ථිර තත්ත්වයක පැවැත්වීය. ඇතැම් වර්ගවල වන සතුන් සංරක්‍ෂණ නො කළ යුතුය. එහෙත් ඉතා ශෝභමාන, අහිංසක, බොහෝ සෙයින් වටිනා සතුන් විශාල සංඛ්‍යාවකගේ පැවැත්මට කෑදරකම, නොසැලකිලිමත්කම සහ නොදනුවත්කම නිසා තර්ජන එල්ලවී ඇත. (මිත්‍යා විශ්වාසය හේතුකොට ගෙන මෙරට එක් ඉබි වර්ගයක මස ඉතා වටිනේය. එම මස අනුභව කිරීමෙන් තමන්ගේ හම තුවාල නොවන තරමට ශක්තිමත් වෙතැයි විශ්වාසයක් පවතී.)

ලංකාවේ සතුන් අතර ඉතාමත් ප්‍රසිද්ධ වූත්, දර්ශනීය වූත් (කෞතුකාත්ම) සතා ඇතාය. මාංසල කොළ වර්ග කෑමට මේ සතා කෙරෙහි පවතින දැඩි ආශාව නිසා උෟට කෙළින්ම ගොවියා සමග තරඟ වදින්නට සිදුවේ. තම වගාව එක් රැයකින් වනසන හොර අලි රංචුවකින් දුප්පත් ගොවියකුට සිදුවන පාඩුව ගැන ඔහු කෙරෙහි අනුකම්පා කිරීම නොවැළැක්විය හැකිය. තමාගේ ගොවිතැන රැක ගැනීමට තුවක්කුවකින් අලින් හට වෙඩි තැබීම ගැන ඔහුට දොස් කිය හැකි ද? වාසනාවට ඇතා ඉතා ප්‍රයෝජනවත්ය., සම්මානනීයය. ඔවුන් නැත්තටම නැතිවී යැමට ඉඩක් නොමැත.

එහෙත් මීට ශතකයකට පමණ ඉහත එක්සත් ජනපදයේ සිටි ප්‍රකෝටි ගණන් පරෙවියන් හට වූදේ සලකන විට, එතරම් ප්‍රසිද්ධියට පත් නොවූ, ලංකාවේ වාසය කරන කුඩා සතුනට කුමකින් කුමක් වේදැයි සිතාගත නොහැකිය. ඔවුන් කෙරෙහි කැලෑ එළි කිරීම, හුණුගල් පර කැඩීම සහ අලුත් කර්මාන්ත බිම් නිසා පොළව, වාතය සහ ජලය දූෂණය වීම බලපායි. ඇතැම් සතුනට මිනිසා තනන පරිසරයේ ජීවත්වියහැකි වුවත්, ඔවුන් එතරම් ලස්සණ වර්ග නොවේ. ගේ කුරුල්ලන්, කපුටන්, මීයන්, කැරපොත්තන් වැනි සතුන්ය. බිම සකස් කරන බුල්ඩෝසරය ඉදිරියේ ලස්සන කුරුල්ලන්, සමනලයන්, කුළැටි උණහපුලුවා, අලංකාර කොටියන් සහ උගේ ගොදුරු වන තිත් මුවන් ගේ අවසානය ළං වේ. ප්‍රිය ජනක ලංකා කැලෑ වාසී දඟකරන වඳුරන්, රිළවුන් හට යන කලදසාව එයමය. මගේ කමිසය අස්සේ සුළු කලක් හෝ ජීවත්වූ ලැන්ගැවර් වඳුරු පැටවා ගැන මම අදත් දුක්වෙමි.

ලෝකය රැකෙන්නේ වනාන්තරවලය යන කියමන ප්‍රඥගෝචරය. අපි ලංකාවේ වන සංරක්‍ෂණයේ යෙදී සිටිමු. ක්‍රිස්තුන් උපදින්නට ශතක පහකට පෙර දේවානම් පියතිස්ස රජුට කියන ලද අයුරු අපි එහි අයිතිකරුවෝ නොවෙමු. ආරක්‍ෂකයන් පමණි.